# ද්විතීයක පාසල්වල ක්‍රියාත්මකවන විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

හේවාවසම් අත්තනායක නිමල් කරුණාතිලක

2004 / MED (PT) P - 13

UCLIB
561475

කොළඹ විශ්වවිද්‍යාලයේ, අධ්‍යාපන පීඨයේ

අධ්‍යාපනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධය,

අධ්‍යාපන පීඨය,

කොළඹ.

17 OCT 2012

561475

## විෂය සමගාමී ක්‍රියාකාරකම් සම්බන්ධව සිදු කළ මෙම පර්යේෂණ අධ්‍යයනයේ සංක්ෂිප්තය

❖ **මාතෘකාව** : ද්විතියක පාසල්වල ක්‍රියාත්මක වන විෂයය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

❖ **කාලීන අවශ්‍යතාව හා වැදගත්කම :**

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පද්ධතියක් ලෙස ගත්කල වඩාත් ඉස්මතු වී පෙනෙන්නේ පෙ.ව. 7.30 - ප.ව. 1.30 අතර කාලයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සම්බන්ධ වී ඇති, මිනිත්තු 40 ක කාලච්ඡේද වලින් සමන්විත විෂය සමූහයක් කාලසටහනකට අනුව පවත්වාගෙන යාමය. මේ සම්බන්ධව ඇගයීම් තක්සේරු කිරීම් මෙන්ම මාසික, වාර අවසාන, විභාග ක්‍රමයක් ද පවතී. එසේම විභාග දෙපාර්තමේන්තුව මගින් 5 ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස.(සා/පෙළ) විභාගය, අ.පො.ස.(උ/පෙළ) විභාගයද පවත්වන්නේ ඉහත විෂය හා බැඳුණු අධ්‍යාපන ක්‍රියාවලිය ඇගයීම පිණිසය. එහෙත් අධ්‍යාපන පද්ධතිය තුළ වරෙක ඉස්මතු වී පෙනෙන නමුත් වරෙක සැඟවී ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් සුවිශේෂී වැදගත්කමක් දරන බව කිව යුතුය. සෑම පාසල් දරුවකුම සමබර පෞරුෂයක් සහිත පුද්ගලයකු බවට පත්කිරීමේ දී විෂය සමගාමී ක්‍රියාකාරකම් තුළින් ඉටුවන සේවාව සුළුපටු නොවේ. ප්‍රජානන, ආවේදන, මනෝචාලක යන ක්ෂේත්‍ර වර්ධනය කිරීමේ දී විෂය සමගාමී ක්‍රියාකාරකම් වලට සුවිශේෂී තැනක් ලැබී තිබේ. මේ නිසා පාසල් අධ්‍යාපනය ලබන සෑම දරුවකු තුළම විෂය සමගාමී කටයුතු කෙරෙහි නැඹුරුවක් ඇති කිරීම සඳහා ජාතික මට්ටමේ සිට පාසල් මට්ටම දක්වාම විවිධ සැලසුම් සකස් කරමින් පවතී. විෂය සමගාමී කටයුතු සාර්ථකව පවත්වාගෙන යන පාසල්වල පාසල් සංවිධානය හා කළමනාකරණය පාසල හා ප්‍රජා සම්බන්ධතා යන අංශවල යහපත් වාතාවරණයක් ඇති වී තිබේ. මේ නිසා සෑම පාසල් දරුවකුටම විෂය සමගාමී කටයුතුවල නිරතවීමේ අවස්ථාව ලබාදීම සිදුවිය යුත්තකි.

## ❖ මෙම අධ්‍යයනයට පදනම් වුණු අරමුණු මෙසේය :

- ද්විතියක පාසල්වල ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් හඳුනාගැනීම හා එහි විවිධත්වය සොයා බැලීම.
- ද්විතීයක පාසල්වල ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා යොදවා ඇති සම්පත් පිළිබඳව විමසා බැලීම.
- විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව ගුරුවරුන්ගේ ආකල්ප විමසා බැලීම.
- විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව විදුහල්පතිවරුන්ගේ ආකල්ප විමසා බැලීම.

## ❖ පර්යේෂණ ක්‍රමවේදය :

විෂය සමගාමී කටයුතු පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම සඳහා ද්විතීයක පාසල්වල විදුහල්පතිවරු හා ගුරුභවතුන්ගෙන් දත්ත ලබාගත් අතර මේ සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල් 79 ක විදුහල්පතිවරු ද එම පාසල්වල එක පාසලකින් ගුරුවරු හතර දෙනා බැගින් 316 ක්ද පර්යේෂණයේ දත්ත ලබාගැනීමට තෝරාගන්නා ලදී. මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ අරමුණුවලින් විෂය සමගාමී ක්‍රියාකාරකම් හඳුනාගැනීමට හා එහි විවිධත්වය සොයා බැලීමටත්, එම ක්‍රියාකාරකම් සඳහා යොදවා ඇති භෞතික හා මානව සම්පත්වල ප්‍රමාණාත්මක බව පිරික්සීම සඳහාත් විදුහල්පතිවරුන්ට පමණක් ප්‍රශ්නාවලියක් ලබාදුන් අතර විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව ආකල්ප විමසා බැලීමේ ප්‍රශ්නාවලිය විදුහල්පතිවරු හා ගුරුභවතුන් යන දෙපිරිසටම ලබාදෙන ලදී. මෙම පාසල් 79 සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප වන කුරුණෑගල, ඉබ්බාගමුව, ගිරිඋල්ල, කුලියාපිටිය, නිකවැරටිය, මහව යන ඒවායෙන් නියෝජනය වන පරිදි 1AB, 1C, 2, 3 යන පාසල් තෝරාගන්නා ලදී. ඉහත සඳහන් විදුහල්පති හා ගුරුභවතුන්ගෙන් ලබාගත් දත්ත, සංඛ්‍යාත වගු, වෘත්ත ප්‍රස්කාර තීරු ප්‍රස්තාර ඇසුරින් විශ්ලේෂණය කරන ලදී.

## ❖ අනාවරණ :

ජාතික මට්ටමින් විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව විවිධ සැලසුම්, ව්‍යාපෘති ක්‍රියාත්මක කළද අධ්‍යාපන අමාත්‍යංශ වලින් වාර්ෂික චක්‍රලේඛන ලිපි ඇසුරින් විෂය සමගාමී ක්‍රියාකාරකම් පවත්වාගෙන යායුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබාදීම සිදුකළද පාසල් මට්ටමේ පවතින සම්පත් ව්‍යුහයේ ස්වභාවය පදනම් කරගෙන එම ක්‍රියාකාරකම් පවත්වාගෙන යන බව පෙනී යයි. එනම් එක් එක් පාසලට ඇති භෞතික හා මානව සම්පත්වල ස්වභාවය අනුව විෂය සමගාමී ක්‍රියාකාරකම් තෝරාගෙන ක්‍රියාත්මක කරනු ලබති.

එලෙසම බොහොමයක් පාසල්වල විෂය සමගාමී කටයුතු සඳහා අවශ්‍ය මානව සම්පත් හිඟය නිසා ආදි ශිෂ්‍ය සංගමය මගින් මෙම හිඟතාවයන් ආවරණය කරනු ලබයි. එසේම ශිෂ්‍ය රුචියට අනුව මෙම ක්‍රියාකාරකම් සැලසුම් කිරීමෙන්ද පාසල් විසින් අඛණ්ඩව පවත්වාගෙන යාමෙන් ද සාර්ථක ප්‍රතිඵල ළඟා කරගත හැකිය.

## ❖ නිගමන

විෂය සමගාමී කටයුතු සඳහා බොහොමයක් පාසල්වල ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් දක්නට නොලැබේ. මේ සඳහා එම පාසල් සතුව පවතින මූල්‍යමය ශක්තිය, සංවිධානමය හැකියාව බලපා ඇත. එලෙසම පාසල්වල විෂය කටයුතුවලදී මෙන් විෂය සමගාමී කටයුතු සඳහා නියාමනයන් සිදු නොවීමද මේ සඳහා හේතු පාදක වී ඇති බව පෙනී යන කරුණකි.

විෂය සමගාමී කටයුතු පිළිබඳව මනා අවබෝධයකින් හා ඒ සම්බන්ධව ධනාත්මක ආකල්ප ඇති විදුහල්පතිවරු හා ගුරුභවතුන් සිටින පාසල්වල ඉතා සාර්ථකව මෙම ක්‍රියාකාරකම් සිදුකරන අතර එම පාසල් ප්‍රාදේශීයව පමණක් නොව ජාතික වශයෙන්ද ප්‍රසිද්ධියට පත්ව ඇත. විෂය සමගාමී වැඩසටහන් නිසා පාසල් කළමනාකරණයට ඉතා පහසුවක් සැලසෙනවා සේම සිසුන්ගේ පෞරුෂ සංවර්ධනයටද මේ තුළින් ලැබෙන පිටිවහල අතිමහත්ය.

සෑම පාසලකම විෂය සමගාමී කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධව ගැටලු පවතී. ඒවා සම්පත් හිඟතාවය නිසා ඇතිවන ගැටලු මෙන්ම වැඩි ශිෂ්‍ය ප්‍රමාණයට සහභාගීවිය හැකි ශිෂ්‍ය රුචියට ගැළපෙන ලෙස සංවිධානය කිරීමේ දී ඇතිවන ගැටලු බව පෙන්වා දිය හැකිය. ඒ අනුව සිසුන් මෙන්ම පාසල් කළමනාකරණය ද විභාග ක්‍රමයට මුල්තැනක් ලබාදීම හේතු කොටගෙන විෂය සමගාමී කටයුතු පිළිබඳව දක්වන සැලකිල්ල අඩුවී ඇති බව පෙනී යන කරුණකි.